

වාර්ෂික වාර්තාව
2020

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා
සෞඛ්‍ය ආයතනය

වාර්ෂික වාර්තාව - 2020

සම්පාදනය:

චම්පිකා අමරසිංහ, මොහාන් පෙරේරා, සඳුලි සුමනදේව

පිටකවරය - තුසිත පෙරේරා

ප්‍රකාශනය:

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ
ප්‍රකාශන කමිටුව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
නො.97, ජාවත්ත පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව
ටෙලි: +94 112 2 585 425

සියලු හිමිකම් ඇවිරිණ

2021

ISBN 978-624-6017-02-6



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය

2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙස ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අප ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ජාත්‍යන්තර මට්ටමෙහි වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සේවාවන් ලබාදීමයි.

ආරම්භයේ පටන්ම සම්මන්ත්‍රණ පැවැත්වීම හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් පුහුණු කිරීම හා සාමාන්‍ය ජනතාව වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීම ආදී කටයුතුවල නිරතවී සිටින්නෙමු. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ වෘත්තීකයන්ට නව දැනුම ලබාදීමට හා ඔවුන්ගේ දැනුම ඔවුන් අතර හුවමාරු කර ගැනීමට අවශ්‍ය පසුබිම අප විසින් නිර්මාණය කරදෙන්නෙමු. වැඩ පරිසරයක් පවත්වාගෙන යාම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, ආරක්ෂාකාරී වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම නිරන්තරයෙන් ලබාදීමට අප කටයුතු කරන්නෙමු.

අප සෑම විටම අපගේ පාරිභෝගිකයන්ට ගරු කරමින් අපක්ෂපාතීව තාක්ෂණික සේවාවන් ලබාදීමට කටයුතු කරන්නෙමු. වෘත්තීය අනතුරු වළක්වා ගැනීමට අවශ්‍ය දැනුම ඔවුන් වෙත ලබාදීමට මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමට ද අප නිරන්තයෙන් කැපවී සිටින්නෙමු. අප ලබා දෙන පුහුණුව තුළින් සේවා ස්ථානයේ ඇති අනතුරු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය විසදුම් ලබා ගැනීමටත් ඔවුන්ට හැකියාව ඇත.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය අප ආයතනය වන බැවින් ශ්‍රී ලාංකික ජනතාවට අවශ්‍ය සේවාව සැපයීම උදෙසා අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

වෛද්‍ය එන් සි අමරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය අධ්‍යක්ෂක මණ්ඩලය

නම	තනතුර	කමිටුව තුළ දරණ තනතුර
එන්.පී.ඩී.යු.කේ. මාපා පතිරණ මහතා	ලේකම් - කම්කරු අමාත්‍යාංශය	සහභපති
වෛද්‍ය එන්. සී. අමරසිංහ මිය	අධ්‍යක්ෂ ජනරාල්	කමිටු සාමාජික
ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා	කොමසාරිස් ජනරාල්	කමිටු සාමාජික
කේ.ඒ.බී. කුරුප්පු මහතා	ප්‍රධාන ගණකාධිකාරි	කමිටු සාමාජික
වෛද්‍ය ඉනෝකා සුරවීර මිය	ප්‍රජා වෛද්‍ය උපදේශක	කමිටු සාමාජික
ඉන්දික ගමගේ මහතා	ප්‍රධාන කළමනාකරු - සමූහ මානව සම්පත් හා පාලන	කමිටු සාමාජික
වජිර ඇල්ලේපොළ මහතා	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	කමිටු සාමාජික
චතුර මොහොට්ටිගේ මහතා	ප්‍රධාන සහකාර ලේකම්	කමිටු සාමාජික
අබේසිරිවර්ධන මහතා	ප්‍රධාන කර්මාන්ත පරීක්ෂක ඉංජිනේරු - කර්මාන්ත සුරක්ෂිතතා	කමිටු සාමාජික
එච්.ආර්.ජේ.කේ. වීරබදුපිටිය මිය	හෙද නිලධාරි	කමිටු සාමාජික
වෛද්‍ය රවින්ද්‍ර උඩුගම මහතා	වෛද්‍ය	කමිටු සාමාජික
වෛද්‍ය පාලිත රාජක්ෂ මහතා	වෛද්‍ය	කමිටු සාමාජික
වෛද්‍ය තිලක් ප්‍රනාන්දු මහතා	විශ්‍රාමික වෛද්‍ය	කමිටු සාමාජික
වෛද්‍ය පුබුදු සුමනසේකර මහතා	විධායක අධ්‍යක්ෂ	කමිටු සාමාජික

පටුන

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය	iii
පටුන	v - vi
පළමු පරිච්ඡේදය (ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය)	1 - 4
1.1 හැඳින්වීම	2
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු	3 - 4
1.3 සුවිශේෂී ප්‍රමුඛතා	4
1.4 ආයතනයෙහි කාර්ය මණ්ඩලයේ සංයුතිය	4
දෙවන පරිච්ඡේදය (ආයතනයේ ප්‍රධාන කාර්යයන්)	5 - 11
2.1 සේවා සැපයීම	6
2.1.1 දෛනික කටයුතු	6 - 10
අ. පාරිසරික මිනුම්	6
ආ. අවදානම් ඇගයීම	6
ඇ. වෛද්‍ය පරීක්ෂණ	6
2.1.2 විශේෂ වැඩසටහන්	7
අ. විශේෂ පුහුණුවීම්	7 - 8
• පළමු මට්ටම	8
• දෙවන මට්ටම	8
• තෙවන මට්ටම	8 - 9
ආ. ව්‍යාපෘති	9
ඇ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල	9
ඈ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය	9
ඉ. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණයන්හී නියැලීම	10
ඊ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය නිලධාරී ජාතික සංගමය	10
උ. සුහසාධන කටයුතුවල නිරතවීම	10

2.1.3 ජාත්‍යන්තර සහයෝගීතාව	**10**
2.2 සේවා පහසුකම් දියුණු කිරීම	**10**
2.2.1 ආයතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීම	**10**
2.2.2 ආයතනයේ වැඩ පරිශ්‍රය දියුණු කිරීම	**11**
තෙවන පරිච්ඡේදය (ආයතනයේ ප්‍රගතිය)	**13- 24**
සිව්වන පරිච්ඡේදය (ආයතනයේ සුවිශේෂ ජයග්‍රහණ)	**25 - 26**
පස්වන පර්‍රිච්ඡේදය (ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය)	**27 - 53**

වගු නාමාවලිය

වගුව 1.1	ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය	**4**
වගුව 3.1	පාරිසරික මිනුම් සමීක්ෂණ	**14**
වගුව 3.2	විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය	**15**
වගුව 5.1	ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය	**30**

පළමු පරිච්ඡේදය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තිය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ස්ථාපිත කරන ලදී.

රටක් සංවර්ධනය කරා යන ගමනේදී එහි ප්‍රධාන දායකත්වය සලසන්නේ එරට වෙසෙන ශ්‍රම බලකාය බව අමුතුවෙන් කිවයුතු කරුණක් නොවේ. ඔවුන් තුළින් තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීමට අවැසි වන්නේ නම් ඔවුන්ගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්පන්නබව ඉහළ මට්ටමක පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය. ශ්‍රී ලංකාව තුළ භාරදුර කර්තව්‍ය ඉටුකරනු වස් ඇපකැප වී කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය ලෙසින් අප ආයතනය ජාතික මෙහෙවරේ නිරත වන්නෙමු. එහිදී, අප නිරන්තරයෙන් සිදු කරන දෛනික කටයුතු, විශේෂ පුහුණුවීම් වැඩසටහන්, ආදිය මඟින් ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායේ සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීමට අප කටයුතු කරනු ලැබේ.

දෛනිකව සිදු කරනු ලබන පාරිසරික මිණුම් සමීක්ෂණ, අවදානම් ඇගයීම හා වෛද්‍ය පරීක්ෂණ මඟින් මෙන්ම විශේෂ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබන පුහුණුවීම්, ව්‍යාපෘති මඟින් හා වෙනත් රටවල් සමග අන්තර්ජාතික සහයෝගිතාවය මත සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩදායී ශ්‍රම බලකායක් බිහිකරවාලීමට අප වගබලා ගන්නෙමු.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස පවතින අප රටෙහි දළ දේශීය නිෂ්පාදනය ඉහළ නංවාලීමට සෘජුවම බලපෑම් එල්ල කරනු ලබන වැඩ කරන ජනතාවගේ සේවයේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කරදෙමින් සංවර්ධනය කරා වේගයෙන් පියනැඟීමට අවශ්‍ය වන ශ්‍රම බලකායක් අප රටට දායාද කිරීම අපගේ චීකායන පරමාර්ථයයි. එසේ යන ගමනේදී අප ආයතනයේ සහාය නොමඳව ලබාදීමට අප නිරන්තයෙන් කැප වී සිටින්නෙමු.

1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම"

මෙහෙවර

"සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබල ගැන්වීම"

ආයතනයේ අරමුණු

(අ) සේවායෝජකයන්ගේ සහ සේවාදායකයන්ගේ ආරක්ෂාව සහ රැකියාවේ ආරක්ෂාව සහ රැකියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ සේවායෝජකයන් සහ සේවාදායකයන් යන දෙපාර්ශවයේම සේවා පරිසරය සම්බන්ධයෙන් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී රජයට උපදෙස් දීම

(ආ) සේවා ස්ථානවල දී රැකියාවට අදාළව සිදුවන හදිසි අනතුරු සහ තුවාල වැළැක්වීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම

(ඇ) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යාපන වැඩසටහන් සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම කරගෙනයාම සහ ඒවාට සහාය දීම

(ඈ) උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකාරී ද්‍රව්‍ය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ යම් ආයතනයකට හෝ තැනැත්තකුට උපදේශන සේවා සැපයීම

(ඉ) වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ හෝ පිටරටක විශ්වවිද්‍යාලයක් සමඟ සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම සහ පුහුණුව අවශ්‍ය කරන සේවා නියුක්තිකයන්ට, පදිංචිකරුවන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අධ්‍යාපන සහ අවශ්‍ය පුහුණුව ලබාදීම සහ ඒ අධ්‍යාපනය හෝ පුහුණුව නිම කිරීමෙන් පසු සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

(ඊ) උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික, ජීවවිද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝ සමාජ අන්තරායන් සහ හදුනාගත් අන්තරායන් වැළැක්වීම පිළිබඳ අවශ්‍ය කරන සේවාවන් සැපයීම

(උ) (i) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යයට අදාළ වන කාරණාවලදී ප්‍රමිති, සංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස්දීම

(ii) වැඩ කටයුතු නිවැරදිව ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය හා නිසියාකාරව සිදු වන්නේ ද යන්න ඇගයීමට ලක්කිරීම

(ඌ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යට අදාළ තොරුතුරු එක්රැස්කිරීම, සකස්කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම

(සෘ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සම්පාදනය කිරීම සහ අනුග්‍රහය දැක්වීම

(සෘෘ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

(ඍ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම

(ඎ) පර්යේෂණ සහ විශේෂ රසායනාගාර සංවර්ධනය කිරීම

(ඏ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන විශ්ව විද්‍යාල හා අනෙකුත් සංවිධාන සමඟ සබඳතා පවත්වාගෙන යාම

(ඐ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම

1.3 සුවිශේෂී ප්‍රමුඛතා

1. වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පනත අනුව කටයුතු කරමින් කාලීන අවශ්‍යතාවයන්ට අනුව සේවා සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ගොඩනංවාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

2. වැඩකරන ජනතාවට ආරක්ෂිත පරිසරයක් තුළ සෞඛ්‍ය සම්පන්නව සේවයේ නිරත වීමට අවශ්‍ය වැඩ පරිසරයන් සේවා ස්ථානය තුළ නිර්මාණය කරදීමට කටයුතු කිරීම

3. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරමින්, නව තාක්ෂණික උපකරණ පිළිබඳව අවබෝධය ලබා දෙමින් ප්‍රමිතියෙන් ඉහළ සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රම සේවා ස්ථානවල පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිමක් සකස් කිරීම

4. කාලීනව සේවා ස්ථානවල පැන නඟින සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළුවලට පිළියම් සෙවීමට නිරන්තරයෙන් කටයුතු කිරීම

1.4 ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

ජ්‍යෙෂ්ඨ මට්ටම		තෘතීය මට්ටම		ද්විතීය මට්ටම		ප්‍රාථමික මට්ටම		එකතුව		
අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	සූරප්පාඩු
07	02	03	03	10	06	05	05	25	16	36%

වගුව 1.1 - ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

දෙවන පරිච්ඡේදය

ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ආයතනයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව විමසා බැලූ කල එය ප්‍රධාන කොටස් 2කින් සමන්විතය. එනම්, සේවා සැපයීම හා සේවා පහසුකම් දියුණු කිරීමයි.

2.1 සේවා සැපයීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධානතම කාර්යයන් වන්නේ සේවාලාභීන්ට අවශ්‍යවන සේවාවන් ලබා දීමයි. එහිදී අප විසින් දෛනික කටයුතු මඟින්, විශේෂ වැඩසටහන් මඟින් හා ජාත්‍යන්තර සහයෝගිතාව මත පදනම් වෙමින් සේවා සැපයීම සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. ඒවා වෙන් වෙන්ව අනු මාතෘකා වශයෙන් පහතින් විමසීමට ලක්කරනු ඇත.

2.1.1 දෛනික කටයුතු

- පාරිසරික මිනුම් සමීක්ෂණ
- අවදානම් ඇගයීම
- වෛද්‍ය පරීක්ෂණ

අ. පාරිසරික මිනුම් සමීක්ෂණ

සේවා ස්ථානවල වැඩ පරිසරය රැකියාවේ නිරතවීමට අවශ්‍ය මට්ටමක පවතින්නේද යන්න පාරිසරික මිනුම් සමීක්ෂණ මඟින් විමසුමට ලක්කරනු ලැබේ. වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම, දුම් පරීක්ෂා කිරීම, කර්මාන්තය තුළ දූවිලි මට්ටම සමීක්ෂණය කිරීම, ශබ්ද මට්ටම මැනීම සහ උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම මෙහිදී සිදුකරනු ලැබේ. වැඩ පරිසරය යෝග්‍ය මට්ටමක පවතින්නේද යන්න උපකරණ යොදා ගනිමින් පරීක්ෂාවට ලක් කිරීම මෙහිදී සිදුවේ. සෞඛ්‍යාරක්ෂිතව සේවයේ නිරතවීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරන අතර ඒ පිළිබඳව නිරන්තර දැනුවත් කිරීම් අප විසින් අදාළ ආයතනය වෙත ගොස් මෙන්ම අප ආයතනය තුළදී ද සිදු කරනු ලැබේ.

ආ. අවදානම් ඇගයීම

සේවයේ නිරත සේවකයන්ට මුහුණදීමට සිදුවන අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කිරීමට අවදානම් ඇගයීම සිදු කරනු ලැබෙයි. එහිදී ද සුරක්ෂිතතා නිළධාරීන් අදාළ ආයතනය වෙත ගොස් එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පරීක්ෂාවට ලක්කරනු ලැබෙයි. ආයතනය පරීක්ෂාවට ලක්කර එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව ඔවුන් දැනුවත් කරන අතර ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබාදීම සිදුකරනු ලබයි.

ඇ. වෛද්‍ය පරීක්ෂණ

සේවකයන්ගේ සෞඛ්‍ය මට්ටම සේවය කිරීමට තරම් යෝග්‍ය මට්ටමක පවතින්නේද යන්න නිශ්චය කිරීම උදෙසා වෛද්‍ය පරීක්ෂණ සිදු කරනු ලැබේ. එහිදී පුද්ගලයන්ගේ ශ්‍රවණ තත්ත්වය මැනීමේ පරීක්ෂණ රුධිර විශ්ලේෂණය, පෙනහළුවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, දෘෂ්ටිය පරීක්ෂණ හා වැඩ කිරීමේ යෝග්‍යතාව තක්සේරු කිරීමේ පරීක්ෂණ අප විසින් සිදු කරන ලබයි. මේ සඳහා වෛද්‍යවරයන් හා අපගේ තාක්ෂණික නිලධාරීන් සහභාගී වන අතර ශ්‍රමිකයන් සේවයේ නිරත වීමට යෝග්‍යවන්නේද යන්න හා ඔවුන් තුළ පවතින

රෝගාබාධ මොනවාද යන්න අදාළ ආයතනය දැනුවත් කරනු ලැබේ. එමෙන්ම ඔවුන් තුළ පවතින රෝගාබාධ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් මොනවාද යන්න පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමද මෙහිදී සිදු කරනු ලැබේ. අප විසින් අදාළ ආයතනය වෙත ගොස් මෙන්ම අප ආයතනය තුළදී ද මෙම පරීක්ෂාවන් සිදු කරනු ලැබේ.

2.1.2 විශේෂ වැඩසටහන්

දෛනික සේවාවන් සැපයීමට අමතරව විශේෂ වැඩසටහන් පවත්වාගෙන යාම අප ආයතනයේ සපයන ප්‍රධාන සේවාවකි. එහිදී පුහුණු වැඩසටහන්, ව්‍යාපෘති, සම්මාන උළෙල පැවැත්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම හා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයන් නියැලීම අප විසින් සිදු කරනු ලැබේ. නිරන්තරයෙන්ම සිදුකරනු ලබන සේවාවන්ට අමතරව රටට සේවාවන් සැපයීමේ මුඛ්‍ය පරමාර්ථය පෙරදැරි කරගනිමින් කර්මාන්තයන්හි පවතින අවශ්‍යතාවන් හඳුනාගෙන මෙම විශේෂ වැඩසටහන් සිදුකරන අතර සමහර අවස්ථාවන්හිදී ආයතනවල ඉල්ලීම මතද මෙම විශේෂ වැඩසටහන් අප විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

අ. විශේෂ පුහුණුවීම්

අප විසින් සිදුකරනු ලබන විශේෂ පුහුණුවීම් වැඩසටහන් ප්‍රධාන මට්ටම් තුනක් යටතේ සිදු කරනු ලැබේ. එහිදී,

- පළමු මට්ටම
- දෙවන මට්ටම
- තෙවන මට්ටම

වශයෙන් ප්‍රධාන මට්ටම් ලෙස අප ආයතනයේ පුහුණු පාඨමාලා හා වැඩමුළු බෙදා වෙන්කර ඇත. එහිදී වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන් ලබා ඇති අධ්‍යාපන මට්ටම් අනුව සහ සේවා පළපුරුද්ද මත මෙම පාඨමාලාවන් හා පුහුණුවීම් සඳහා සහභාගිවීමට අවස්ථාව හිමි කර දෙනු ලැබේ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව, ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05), ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහතික පත්‍ර පාඨමාලාව හා කෙටිකාලීන පුහුණුවීම් වැඩසටහන් අප විසින් පවත්වනු ලැබේ. එහි පාඨමාලා සැලැස්ම පහත ආකාරයට දැක්විය හැකිය.



රූපසටහන 2.1 පාඨමාලා සැලැස්ම

■ පළමු මට්ටම

අප විසින් සිදුකරනු ලබන කෙටි කාලීන පුහුණු වැඩමුළු පළමු මට්ටමට ඇතුළත් වන විශේෂ පුහුණු වීම් ලෙස දැක්විය හැකිය.

- ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන වැඩමුළු
- අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණුවීම් වැඩමුළු
- වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු
- හෙදියන් සඳහා වන වැඩමුළු
- සෞඛ්‍ය සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- කාර්යාල සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- රසායනාගාර සේවකයින් සඳහා රසායනාගාර ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- ආහාර කළමනාකරණය සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- කාර්මික සේවකයින් සඳහා ආරක්ෂිත රසායනික කටයුතු පිළිබඳ වැඩමුළු
- සේවකයින් සඳහා යහපත් මානසික සෞඛ්‍යයන් පවත්වාගෙන යාම පිළිබඳ වැඩමුළු

මෙම පුහුණුවීම් දිනක්, දෙකක් හෝ තුනක් සාමාන්‍ය වශයෙන් පවත්වනු ලැබේ. සමහර අවස්ථාවලදී කර්මාන්තයන්හි ඉල්ලීම පරිදි මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ. මෙම පුහුණුවීමේ වැඩසටහන් පළමු මට්ටමේ පුහුණුවීම් වන අතර අදාළ පුහුණුවීම් අවසානයේ දී ඔවුන් ලැබූ පුහුණුව පිළිබඳව සහතික පත්‍රයක් ද ඔවුන් වෙත ලබාදීමට අප කටයුතු කරනු ලැබේ.

■ දෙවන මට්ටම

දෙවන මට්ටමට අයත් පුහුණුවීම් වැඩසටහන් ලෙස ප්‍රධාන වශයෙන් අප පවත්වනු ලබන්නේ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ වූ සහතිකපත්‍ර පාඨමාලාවයි. වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව ආධුනිකයන් සඳහා මෙම පාඨමාලාව යෝග්‍ය වන්නේය. අධ්‍යාපන මට්ටම අඩු තත්ත්වයන් පැවතියද මෙම ක්ෂේත්‍රයේ අවුරුදු දෙකකට වඩා වැඩි පළපුරුද්ද ලබාගත් පුද්ගලයකුට න්‍යායාත්මක දැනුම පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට මෙම සහතික පත්‍ර පාඨමාලාව තුළින් හැකියාව ලැබෙන අතර අප ආයතනය තුළ දින 15ක් පුරාවට අධ්‍යාපනය ලබා දෙමින් මෙම සහතික පත්‍ර පාඨමාලාව පවත්වනු ලැබේ. සේවයේ නිරත පුද්ගලයන්ට සහභාගී විය හැකි පරිදි සති අන්තයේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම ආයතනයන්හි ඉල්ලීම මත අප විසින් සති තුනක් පුරා නොකඩවා මෙම සහතික පත්‍ර පාඨමාලාව සිදු කරන අවස්ථාද ඇත.

දින 15ක අධ්‍යයන කාලය නිම වීමෙන් පසුව ඔවුන්ගේ දැනුම පරීක්ෂා කර බැලීමට විභාග පවත්වනු ලබන අතර ඒ අතරින් සමත්වන පිරිසට සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු කරනු ලැබේ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ සුදුසුකම් සපුරා ඇති වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම පුද්ගලයකුට මෙම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව අප විසින් ලබා දෙනු ලබයි.

■ තෙවන මට්ටම

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත වැඩබිම් බිහිකරවාලීම සඳහා අවශ්‍ය වන වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් බිහිකරනු වස් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන තෙවන මට්ටමේ පුහුණුවීම් හේතු

පාදක වන්නේය. ජාතික වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාව මේ සඳහා අයත් පුහුණුවීම් ලෙස දැක්විය හැකිය. මේ වන විට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව අප විසින් පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහා NVQ 05 තත්ත්ව සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

කර්මාන්තයන්හි පවතින අවශ්‍යතා තක්සේරු කිරීමෙන් අනතුරුව ඩිප්ලෝමා පාඨමාලාව සකස් කර ඇත. මෙය මොඩියුල තුනකින් පවත්වන අතර ඒවා, වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය මොඩියුලය, වෘත්තීය ආරක්ෂණ මොඩියුලය සහ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය මොඩියුලය ලෙස සකස් කර ඇත. එක් එක් මොඩියුලයන් සඳහා අවශ්‍ය දැනුම මාස හතරක් පුරාවට ලබා දෙන අතර එක් එක් මොඩියුල අවසානයේදී ඒ සඳහා මොඩියුල විභාගය පවත්වනු ලැබේ. එසේම මොඩියුල තුනම අවසානයේදී තමා ලබාගත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම උපයෝගී කරගනිමින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතුව ඇත. අවසානයේ ව්‍යාපෘති වාර්තාවන් සමග VIVA සඳහා ඉදිරිපත් වී තමා ලබාගත් දැනුම පිළිබඳව විභාගයට ලක් කරනු ලැබේ. විභාගවලදී මෙන්ම ව්‍යාපෘති වාර්තාවට හා VIVA සඳහා ලබාගත් ලකුණු අනුව සලකා බලා ඔවුන් වෙත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව ඩිප්ලෝමාව පිරිනමනු ලැබේ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට අවශ්‍ය කටයුතු ප්‍රතිපාදනය කරගනිමින් එම කටයුතු සකස් කිරීම මේ දිනවලදී සිදු කරනු ලැබේ. හැකි ඉක්මනින්ම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම අපගේ අපේක්ෂාවයි.

ආ. ව්‍යාපෘති

ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්ව මෙරට වැඩකරන ජනතාවගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ගොඩනංවාලීමට අදාළ වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අප කටයුතු කරන්නෙමු. විදේශ ආධාර ලබා දෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආධාර උපකාර වැඩකරන ජනතාව වෙත ලබා දීමට අවස්ථාව සලසාදීම මෙවැනි ව්‍යාපෘති මඟින් අප සිදු කරන්නෙමු.

ඇ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල සංවිධානය කිරීම

වැඩකරන ජනතාව වෙනුවෙන් කැපවී කටයුතු කරන කර්මාන්තයන් ඇගයීමට ලක් කිරීම අප මෙතුළින් අපේක්ෂා කරන්නෙමු. නිවැරදි ලෙස තම සේවාදායකයන්ගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳව නිරන්තරයෙන්ම විමසුමට ලක් කරමින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම පිළිබඳව ඇගයීම මෙන්ම අනෙකුත් කර්මාන්තයන්ටද ඒවායේ ආදර්ශය ලබා දීම මෙමඟින් සිදුවේ. මෙවැනි සම්මාන උළෙලකදී සම්මාන ලබාගැනීමට කර්මාන්තයන් නිතැනින්ම කැමැත්තක් දක්වන අතර ඒ තුළින් ලංකාව පුරා සුරක්ෂිත වැඩබිම් ඉදිකිරීමට හැකියාවක් උදාවේ. සෑම වසර දෙකකට වරක් මෙම සම්මාන උළෙල පැවැත්වීමට අප කටයුතු සම්පාදනය කරන්නෙමු.

ඈ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සම්මන්ත්‍රණය සංවිධානය කිරීම

වැඩ කරන ජනතාවගේ සුරක්ෂිතභාවය පිළිබඳව සුරක්ෂිතතා නිලධාරීන් හට නව තාක්ෂණික දැනුම ලබා දීමට හා නව තාක්ෂණික උපකරණ ආදිය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සම්මන්ත්‍රණ උළෙල සංවිධානය කරනු ලැබේ. මෙහිදී විදේශ සම්පත් දායකත්වයද ලබා ගනිමින් ඔවුන් සතු නව දැනුම අප රටට ලබා ගැනීමට අප කටයුතු කරන්නෙමු. තවද මෙහිදී න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික පුහුණුවද සුරක්ෂිතතා නිලධාරීන් වෙත ලබා දීමට අප උත්සහ දරන්නෙමු.

ඉ. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයන්හි නිරතවීම

දිනෙන් දින යාවත්කාලීන වන තොරතුරු පිළිබඳව වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් දැනුවත් කිරීම අප ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන බැවින් ඒ සඳහා පර්යේෂණ සිදුකරමින් නව තොරතුරු ලබා ගැනීමට සිදුවේ. මේ හේතුවෙන් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව සිදුකරන පර්යේෂණයන් පිළිබඳව අප දැනුවත් වන අතරම ඒ සඳහා අපට හැකි දායකත්වය දීමටද අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

ඊ. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා ජාතික සංගමය පිහිටුවීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ වෘත්තිකයන්ට හා අපගේ සිසුන්ට අවශ්‍ය කටයුතු සඳහා අවස්ථාව ලබා දීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය නිලධාරී ජාතික සංගමය පිහටුවන ලදි. කොළඹ හිල්ටන් හෝටලයේදී සමාරම්භක උළෙල පවත්වා මෙය ආරම්භ කරන ලදී. වෘත්තිකයන් හා සිසුන් වෙත වරප්‍රසාද ලබා දීම මෙමඟින් අපේක්ෂිතය.

උ. සුභසාධන කාර්යන්හි නිරත වීම

නොයෙක් අඩුපාඩුකම් හේතුවෙන් තමන්ට අවශ්‍ය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්පන්නභාව පවත්වාගත නොහැකි වෘත්තිකයන් උදෙසා සුබසාධන සේවාවන් සලසාදීමට අප නිරන්තරයෙන්ම කටයුතු කරන්නෙමු. එමෙන්ම පාසල් සිසුන් තුළ මනා සෞඛ්‍ය පුරුදු ඇති කිරීම උදෙසා නිරන්තර දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් උදෙසා අප දායකත්වය ලබා දෙන්නෙමු. ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ස්ථාපිත කරනු වස් අවශ්‍ය සෑම අවස්ථාවකදීම ඉදිරිපත් වී එම ජාතික වගකීම අප කර මතට ගෙන කටයුතු කිරීමට අප ඇපකැපවී සිටින්නෙමු.

2.1.3 ජාත්‍යන්තර සහයෝගිතාව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව ජාත්‍යන්තරය හා සම්බන්ධ වී කටයුතු කිරීමට අප වගබලා ගන්නෙමු. ජාත්‍යන්තර ආයතන සමඟ උරෙනුර ගැටෙමින් ඔවුන් හා එක්ව යමින් ජාත්‍යන්තරයේ සහයෝගය අප රට වෙත ලබාගැනීමට අප නිරන්තරයෙන්ම උත්සහා දරන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමට අප ආයතනයට අවස්ථාව හිමිවී තිබේ.

2.2 සේවා පහසුකම් දියුණු කිරීම

අප ආයතනයේ ප්‍රමිතිය ඉහළ මට්ටමට නංවා ගැනීම උදෙසා මෙන්ම භෞතික පහසුකම් දියුණු මට්ටමකට ගෙන ඒමට අප නිරන්තයෙන්ම උත්සහ දරන්නෙමු. එහිදී ආයතනයේ ප්‍රමිතිය පවත්වා ගැනීමට ආයතනයේ සේවා පරිසරය ද වැඩ කිරීමට යෝග්‍ය පරිදි ගොඩ නංවාලීමට අවැසි කටයුතු සම්පාදනය කිරීමට අප වගබලා ගන්නෙමු.

2.2.1 ආයතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ගැනිමට අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීම

අපගේ පුහුණු වැඩසටහන් ඉතාම ඉහළ මට්ටමේ ප්‍රමිතියක් යටතේ අප විසින් සිදු කරනු ලැබේ. ඒ සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති සහතික අප වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙහිදී සිදු කරනු ලැබේ. ISO තත්ත්ව සහතිකය මෙන්ම NVQ සහතිකය අප ආයතනය වෙත ලබා ගැනීමට හැකියාව උදාවී තිබීම පිළිබඳව අප තුළ ඇත්තේ අවිහිංසක සතුටකි.

2.2.2 ආයතනයේ භෞතික පහසුකම් දියුණු කිරීම

වෘත්තිකයන්ට ප්‍රිය මනාප පරිසරයක් නව සේවා පරිසරය තුළ ගොඩනැංවීමට උපදෙස් සපයන අප ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය තුළ සේවා පරිසරයද ප්‍රියමනාප පරිසරයක් ලෙස සකස් කිරීමට උත්සහ කරන්නේ අප ආයතනයේ සේවකයින්ට ප්‍රියමනාප පරිසරයක් තුළ සේවාවන් ඉටු කිරීමට අවස්ථාව ලබා දීමට මෙන්ම, වෘත්තිකයන්ට හිතකර පරිසරයක් ගොඩනංවාදීමේ අවශ්‍යතාව ක්‍රියාවෙන්ම සනාථකර දීමටයි.

තෙවන පරිච්ඡේදය

ආයතනයේ ප්‍රගතිය

ආයතනයේ ප්‍රගතිය

3.1 සේවා සැපයීමේ ප්‍රගතිය

සේවා ස්ථානවල සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සෞඛ්‍ය ගැටළු අනතුරු සිදුවීමට ඇති අවස්ථා තිබේද යන්න පරීක්ෂා කිරීම ආයතනයේ දෛනික කාර්යයකි. ඒහිදී පාරිසරික තත්ව අධීක්ෂණය මෙන්ම ශබ්දය, ආලෝකය, උෂ්ණත්වය, දූවිල්ල හා වාතය පිළිබඳ තත්වය පරීක්ෂාකර සේවකයින්ට සිදුවිය හැකි හානි ඇතිවීමේ අවධානම අඩු කිරීමට ආයතනය විසින් දායකත්වය සපයනු ලබයි.

පාරිසරික සමීක්ෂණ	ආයතන ප්‍රමාණය
ශබ්දය	706
ආලෝකය	1185
උෂ්ණත්වය	698
දුවිල්ල	768
වාතය	159
වාත සමීක්ෂණය	150

වගුව 3.1 පාරිසරික මිනුම් සමීක්ෂණ ප්‍රමාණය

2020 වර්ෂයේදී සිදු කරනු ලැබූ වෛද්‍ය පරීක්ෂණ සංඛ්‍යාව පහත පරිදිවේ.

ආයතනවල සේවයේ නියුක්තවූවන්ගේ සෞඛ්‍ය තත්වය සේවා සැපයීම සඳහා සුදුසු මට්ටමක පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා ආයතනය විසින් වෛද්‍ය පර්යේෂණ සිදු කරනු ලබයි. එහිදී සේවාදායකයන්ගේ දෘෂ්ටිය ආදිය පරීක්ෂා කර බලා සේවයේ නියුක්ත වීමට සුදුසු පරිදි සෞඛ්‍ය සම්පන්නව සිටීද යන්න තහවුරු කරනු ලබයි.

3.1.2. විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

ආයතනවල සෞඛ්‍ය හා ආරක්ෂිත බව පවත්වාගෙනයාම උදෙසා ආයතන මට්ටමින් සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරීන් සේවයේ යොදවා ගැනීමෙන් මහත් පිටිවහලක් ලැබේ. එහිදී නිසි න්‍යායාත්මක දැනුමක් මෙන්ම ප්‍රායෝගික අත්දැකීම්ද සපිරි සුරක්ෂිතතා නිළධාරීන් පුහුණු කිරීම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් ක්‍රියාවට නංවනු ලබන විශේෂ වැඩසටහනනක්වේ. 2020 වර්ෂයේදී සිදුකරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදිවේ.

මට්ටම	වැඩසටහන	කාලපරිච්ඡේදය
පළමු මට්ටම	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2020 සැප්තැම්බර් 02 - කණ්ඩායම් 19 2020 සැප්තැම්බර් 26 - කණ්ඩායම් 20 2020 ඔක්තෝම්බර් 18 - කණ්ඩායම් 21
දෙවන මට්ටම	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	2020 පෙබරවාරි 08 - කණ්ඩායම 36 2020 සැප්තැම්බර් 26 - කණ්ඩායම 37 2020 ඔක්තෝම්බර් 28 - කණ්ඩායම 38
තෙවන මට්ටම	Access Engineering Technical Staff සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වූ දින හයක වැඩමුළුව	2020 ජනවාරි 03
	Confine Space එක්දින වැඩමුළුව	2020 පෙබරවාරි 13
	Safe Handling Hazard Materials එක්දින වැඩමුළුව	2020 පෙබරවාරි 14
	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව (Foundation Course)	2020 පෙබරවාරි 17
	Route Cause Analysis එක්දින වැඩසටහන	2020 මාර්තු 12

වගුව. 3.2 විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

2020 වර්ෂයේදී රට තුළ පැවති වසංගත තත්වය හමුවේ ආයතනයේ පාඨමාලා පැවැත්වීම අපේක්ෂිත පරිදි සිදු කිරීමට බාධා ඇති විය. සාමාන්‍ය තත්වය යටතේ ආයතනය විසින් වසරකට ඩිප්ලෝමා පාඨමාලා දෙකක් පවත්වනු ලැබුවද 2020 වර්ෂයේදී රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ඩිප්ලෝමා පාඨමාලා එකක් පමණක් නිම කිරීමට හැකි විය. ඒසේම ජාතික ව්‍යාත්තීය සුරක්ෂිතතා හ සෞඛ්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා දෙකක් නිම කිරීමට 2020 වර්ෂයේදී ද හැකියාව ලැබී ඇත. සාමාන්‍ය තත්වය යටතේ වසරකට සහතික පත්‍ර පාඨමාලා හයක් පමණ පවත්වන ලදී.

ආයතනය විසින් පවත්වනු ලබන ජාතික ව්‍යාත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ පදනම් පාඨමාලාව 2020 පෙබරවාරි මස 14 වන දින සිට දින 10ක කාලපරිච්ඡේදයක් තුළ පවත්වන ලදී. 2019 වර්ෂයේදී මුල් වරට පවත්වන ලද පදනම් පාඨමාලාවේ දෙවන කණ්ඩායම සාර්ථකව පාඨමාලාව නිම කරන ලදී. මෙහිදී ඇක්සස් ඉංජිනියරින් ආයතනයේ දායකත්වයද අප වෙත ලබා දෙන ලදී. අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් සිසුන් 25 දෙනෙකු තෝරා ගෙන ඔවුන්ට ව්‍යාත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික පුහුණුව කිසිදු අයකිරීමකින් තොරව ලබාදෙන ලදී. පාඨමාලාව අවසානයේ එම සිසුන් හොල්සිම් සංස්ථා ආයතනයේ හා ඇක්සස් ඉංජිනියරින් ආයතනයේ රැකියා සඳහා අනුයුක්ත කරන ලදී.

2020 වර්ෂයේදී ඉදිකිරීම් ක්ෂේත්‍ර සඳහා දින හයක වැඩමුළුවක්ද, ඤබසෙබැ්චීජැ පිළිබඳව එක් දින වැඩමුළුවක්ද,ැ්ඉ ඣ්බාකසබට ඣ්රා ජ්වැරස්කි පිළිබඳව එක්දින වැඩමුළුවක් හා සෘදමවැ ක්ඕැ ්බ්කහිසි පිළිබඳව එක් දින වැඩසටහනක් ද සිදු කරන ලදී. සාමාන්‍යයෙන් පුහුණු පාඨමාලාවන්ට අමතරව පුහුණු වැඩසටහන් 15ට අධික ප්‍රමාණයක් ආයතනය විසින් සිදු කරනු ලැබුවද 2020 වර්ෂයේ රට තුළ පැවැති කොවිඩ් 19 තත්ත්වය හමුවේ එසේ සිදු කිරීමට හැකියාව අහිමි විය. අපගේ ඩිප්ලෝමා, සහතික පත්‍ර හා පදනම් පාඨමාලාව සිදු කරනු ලබන සිසුන් හට වාර්ෂිකව සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උළෙලක් පවත්වනු ලැබුවද 2020 වර්ෂයේ පැවති සෞඛ්‍ය නීති රීති අනුව එසේ සිදු කිරීමට නොහැකි විය.

3.1.3 ව්‍යාපෘති වැඩසටහන්වල ප්‍රගතිය.

කොවිඩ් 19 හේතුවෙන් බිඳ වැටීමට ලක් වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රම අනුගමනය කරමින් තම ව්‍යාපර නැවත ක්‍රියාවට නැංවීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරදීම ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා ඒකාබද්ධව සිදු කරන ලදී. එහිදී කොවිඩ් 19 අවදානම වැඩි වශයෙන් පැවති බස්නාහිර පළාතේ කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්ක තුළ මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලදී. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් තෝරා දෙනු ලැබූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 200ක් මේ සඳහා තෝරා ගන්නා ලදී. එසේ තෝරා ගනු ලැබූ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර ස්ථාන වෙත ගොස් ඔවුන්ට ව්‍යාත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ කොවිඩ් 19 හමුවේ ක්‍රියාත්මක කළ යුතු වැඩපිළිවෙළ හා ව්‍යාත්තීමය වශයෙන් සිදු විය හැකි අනතුරු පිළිබඳව දැනුවත් කිරීම සිදු කරන ලදී. මෙහිදී කොවිඩ් 19 තත්ත්වය හමුවේ මුහුණ දිය යුතු ආකාරය පිළිබඳව මාර්ගෝපදේශ සිංහල භාෂාවෙන් සකස්කර බෙදාහරින ලදී. වසංගත තත්වය හමුවේ මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින ව්‍යවසායකයන්ට කොවිඩ් 19 හමුවේ අනුගමනය කළ යුතු සෞඛ්‍යරාක්ෂිත ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය වන උපකරණ (සින්ක්, විෂබීජනාශක දියර, සබන්, අත්සෝදන දියර, මුඛ ආවරණ, අත් ආවරණ ආදිය) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය දායකත්වයෙන් ලබාදෙන ලදී.

මෙම වැඩසටහනේ පළමු අදියර 2020 වර්ෂයේ දෙසැම්බර් මාසය වන විට අවසන් කරන ලදී. විශේෂයෙන් මෙම ව්‍යාපෘතිය තුළින් ආහාර නිෂ්පාදනය ආශ්‍රිත ව්‍යාපාරයන්හි නිරත ව්‍යවසායකයන්ට මහත් පිටිවහලක් ලබා ගැනීමට හැකියාව ලැබිණි. එමෙන්ම තම ව්‍යාපාර

කටයුතුවලදී සිදු විය හැකි හදිසි අනතුරු පිළිබඳව ඔවුන් විධිමත් ආකාරයෙන් දැනුවත් කිරීම සිදු කරන ලදී.

රට තුළ පවතින වසංගත තත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී. මාර්ගගත ක්‍රමයට සහභාගී විය නොහැකි ව්‍යාවසායකයන් දැනුවත් කිරීම සඳහා කොවිඩ් 19 සෞඛ්‍ය මාර්ගෝපදේශ වලට අනුකූලව වැඩමුළු හයක් මීරිගම, කැලණිය, බේරුවල, මොරටුව, මීගමුව හා බුලත්සිංහල යන ප්‍රදේශවලදී පවත්වන ලදී. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික දැනුවත්වීම් ද ඔවුන් වෙත ලබා දීමට අප හට අවස්ථාව උදාවිය.

කොවිඩ් 19 තත්ත්වය හමුවේ වැඩ කරන ජනතාව සෞඛ්‍යාරක්ෂිතව සේවයේ යෙදවීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදු කරනු ලැබූ මෙහෙවර

1. කර්මාන්ත සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම.

කොවිඩ් 19 හමුවේ කර්මාන්තශාලාවන් තුළ දී ආරක්ෂා වීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කරමින් පොතක් මුද්‍රණය කර කර්මාන්ත වෙත ඒවා නොමිලේ ලබා දීමට කටයුතු කරන ලදී.



2. දැනුවත් කිරීමේ පෝස්ටර් පත්‍රිකා සකස් කිරීම

වසංගත තත්වය හමුවේ කර්මාන්තශාලා පවත්වාගෙන යායුතු ආරක්ෂණ පිළිවෙත් සම්බන්ධව දැනුවත් කර පෝස්ටර් නිර්මාණය කර කර්මාන්ත අතර නොමිලේ බෙදාදීමට කටයුතු කරන ලදී.




කොරෝනා වයිරසය සමඟ එදිනෙදා කටයුතු කරගෙන යාම
මුළු ලෝකයටම තර්ජනයක් වෙලා ඇති මාරාන්තික 'කොරෝනා වයිරසය' ශ්‍රී ලංකාවටද විශාල තර්ජනයක් විය හැකිය. මේ වයිරසය ගැන නිසියාකාරව දැනුවත් වීම, මෙම අවධානමෙන් ආරක්ෂා වීමට අපට උදව් වේවි.
රෝග ලක්ෂණ
• හෙම්බිරිස්සාව • උගුරේ වේදනාව
• හිසරදය • උණ
• කැස්ස • ඇඟපත රුදුව
රෝග බෝවන ක්‍රම
• රෝගය වැළඳුණු රෝගියකු මගින්
• කැස්ස හා කිවිසුම් යාමෙන් වාතයට එක්වන කෙළ බිඳිති මගින්
• වැළඳුණු අයකු සමීපව හෝ වැළඳ ගැනීම මගින්
• වෛරසය තැවරුණු තැනක් හෝ දෙයක් ස්පර්ශ කොට මුඛය, නාසය හෝ ඇස ඇල්ලීම මගින්
ආරක්ෂාවට පියවර
• විෂබීජනාශක දියර හෝ සබන් මගින් දෑත් නිවැරැදි ලෙස පිරිසිදු කර ගන්න
• ජනතාව වැඩි වශයෙන් ගැවසෙන තැන්වලදී මුඛ ආවරණයක් (N95/Surgical Mask) පැළඳීම සහ කැස්ස හෝ කිවිසුම් ඇති විට මුඛ ආවරණයක් භාවිතා කරන්න
• කැස්ස හෝ කිවිසුම් ඇති වන විට මුඛ ආවරණයක් නොමැති නම් වැලමිටෙන් නාසය, මුඛය ආවරණය කරන්න
• ඇඟ සීතල හෝ උණ වැනි රෝග ලක්ෂණ ඇති රෝගී අයකු සමඟ සමීප ඇසුර හෝ වැළඳ ගැනීමෙන් වැළකින්න
• සේවා ස්ථානයේ හා පොදු ස්ථාන වල මීටරයක දුරින් සිටීම
ඉහත රෝග ලක්ෂණ ඇත්නම් වහාම වෛද්‍යවරයකු වෙත යොමු වන්න
ශ්‍රී ලංකා ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසාය අංශයේ සෞඛ්‍ය සම්පන්න සමාජ-ආර්ථික ප්‍රකෘති ව්‍යාපෘතිය
International Labour Organization
Ministry of Skills Development, Employment & Labour Relations
NIOSH National Institute of Occupational Safety and Health • Sri Lanka
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
www.niosh.gov.lk



වයිරසය අප ලඟම විය හැකියි!

කොවිඩ්-19 රෝග වාහකයා මිනිසාමයි. පුරවැසි ඔබ අපමයි. නොදැන අප තුලද වයිරසය තිබිය හැකියි. නොසැලකිල්ලෙන්, නොදැනුවත්කමින් එය පැතිරවීමට ඉඩ ඇත. ඔබ අප රටක් විනාශ කළ අයකු වීමට පෙර, මේ මොහෙතේම ක්‍රියත්මක වෙමු. රජය විසින් දැනුවත් කර ඇති සෞඛ්‍ය ක්‍රියා හා නීති දැඩිව, විනයක් ඇතිව පිළිපදිමු.

නිවෙස් තුළම රැඳෙමු. රට වෙනුවෙන් යුතුකම ඉටු කරමු !

Ministry of Skills Development, Employment & Labour Relations

NIOSH National Institute of Occupational Safety and Health - Sri Lanka


කෑම ගැනීමේදී පුද්ගලයින් දෙදෙනෙකු අතර අඩුම තරමින් මීටරයකවත් දුරක් තබා ගැනීම
1 Meter
අත් පිරිසිදු කර ගැනීමට ඇති ස්ථාන අතර අවම වශයෙන් මීටරයක දුරක් තබා ගැනීම
1 Meter
සෑම ආහාර වේලකින්ම පසුව පිඟන් හා විදුරු සබන් (Disinfectant) යොදා පිරිසිදු කිරීම (උණු වතුරෙන් සේදීම වඩාත් යෝග්‍ය වේ)
අත් පිරිසිදු කරගැනීමට ඇල්කොහොල් අඩංගු විෂබීජනාශක දියර හා පාවහන් විෂබීජහරණය සඳහාම තනා ඇති පාපිසි සූදානම් කර තැබීම
මෙහෙයුම අවසන් නැත
හෝජනාගාරයේදී සෞඛ්‍යාරක්ෂිතව හැසිරෙන්න
සේවා ස්ථානයේ භෝජනාගාරය, එක් වර විශාල සේවක පිරිසක් එක් වන හා සේවක සුහදත්වය සමීප කරන පොදු ස්ථානයකි. නමුත් කොවිඩ්-19 වෛරස උවදුර තවමත් අවසන් වී නොමැති බැවින් ආරක්ෂක පුරුදු අනුගමනය කිරීමට අපට සිදුවන අතර ඒ පුරුදු නිරතුරුව ඉටු කරමු. කොවිඩ්-19 මර්දනයට සහය දෙමු!
සෑම ආහාර අනුභවයකින්ම පසුව මේස හා පුටු විෂබීජනාශක යොදා පිරිසිදු කිරීම
ජලය පානය සඳහා ඉවත දැමිය හැකි කෝප්ප භාවිතයට තැබීම
කෑම ගැනීමේදී තවත් කෙනෙකුට ආහාර භුවමාරුව නොකිරීම
ආහාර ගන්නා පෝළිමේ දෙදෙනෙකු අතර මීටරයක දුර පවත්වා ගෙන යාම
භෝජනාගාරය තුල සමාජ ක්‍රියාකාරකම් / මුණගැසීම් / පුවත් පත් බැලීම් අවම මට්ටමකින් පවත්වා ගෙන යාම
භෝජනාගාරයට ඇතුල්වෙන තැන පාදයෙන් ක්‍රියාත්මක කළ හැකි වතුර කරාම /Elbow taps සමඟ සබන් හෝ විෂබීජනාශක දියර හා පාදයෙන් විවර කල හැකි කසළ බඳුන් ලැස්ති කර තිබීම
ආහාර පිළියෙල කරන හා ආහාර පිළිගන්වන පුද්ගලයින් නියම කරන ලද 'පුද්ගල ආරක්ෂිත පැළඳුම්' ඇඳ තිබීම (අත් වැසුම්, මුඛ ආවරණ, මුහුණු ආවරණ)
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පණිවිඩයකි
Ministry of Skills Development, Employment & Labour Relations
NIOSH
National Institute of Occupational Safety and Health • Sri Lanka
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
www.niosh.gov.lk

මෙහෙයුම අවසන් නැත
ගමනාගමනයේදී වගකීම ඉටු කරමු

කොවිඩ්-19 වෛරසය උවදුර තවමත් අවසන් වී නොමැති අතර නිරන්තරයෙන් ආරක්ෂිත සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමට සිදු වී ඇත. කාර්යාල වාහන භාවිතයෙදීත් අප ඉතා ප්‍රවේශම් විය යුතු අතර ඒ ප්‍රවේශම වෛරසය තවත් කෙනෙකුට පැතිරීම නැවැත්වීමටය. අප ආරක්ෂා වී කොවිඩ්-19 මර්දනයට සහාය වෙමු!



කාර්යාල වාහන භාවිතයෙදී

කවුළු (shutters) විවර කල හැකි, වාතය ලෙහෙසියෙන් එහා මෙහා ගමන් කල හැකි වාහනයක් වීම



ගමන් ගන්නා පිරිස අතර ආරක්ෂිත දුර ප්‍රමාණය තබා ගෙන යාම



වාහනයේ දොර අසල අත් පිරිසිදු කර ගැනීමට විෂබීජනාශක දියර බෝතල් සවි කිරීම



රියැදුරු අනෙක් මඟින්ගෙන් වෙන් කිරීම (ඉටි හෝ සුදුසු අමු ද්‍රව්‍යයක් යොදා)



රියදුරුගේ වගකීම

දිනපතා ස්වයං සෞඛ්‍ය ඇඟයීමක් හා එහි වාර්තාවක් පවත්වාගෙන යාම



රාජකාරිය අතර හෝ නිම වීමෙන් පසුව කිසිවෙකුට රථය තුලට ඇතුලු වීමට ඉඩ නොදීම



විෂබීජනාශක නිතරම වාහනය තුල තැබීමට වග බලා ගැනීම



වාහනය මඟින් සමඟ පදවන වේලාවන්වලදී මුහුනු ආවරණයක් පැළඳීම



වාහනය විෂබීජහරණය කිරීමේදී

සෑම ගමනකට පෙර වාහනය හොඳින් විෂබීජහරණයට ලක් කිරීම

විෂබීජහරණය කිරීමේදී විශේෂයෙන් සැලකිය යුතු කරුණු අතර

- වාහනයේ පිටත හා රෝද විෂබීජහරණය
- වාහනයේ ඇතුළත විෂබීජහරණය



විෂබීජහරණයෙන් පසුව වාහනය අඩුම තරමින් විනාඩි 15 වත් වාතයට නිරාවරණය කර තැබීම



මඟින්ගේ වගකීම

වාහනයට ඇතුල්වීමේදී හා පිටවීමේදී විෂබීජනාසකයකින් දෑත් පිරිසුදු කර ගැනීම



මුඛ ආවරණ ගමනාන්තය දක්වා පැළඳ සිටීම



කුමන හෝ රෝග ලක්ෂණයක් ඇත්නම්, සෙසු අය අනතුරේ නොදමා නිවසේ රැඳීම හා වහාම වෛද්‍යවරයකු ඇමතීම



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පණිවිඩයකි

Ministry of Skills Development, Employment & Labour Relations

NIOSH National Institute of Occupational Safety and Health - Sri Lanka

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
අංක. 97, පාර්ලිමේන්ත පාර, කොළඹ 05 • 011 2 585 425, 011 2 598 672
www.niosh.gov.lk


මෙහෙයුම අවසන් නැත
කවදත් ව්‍යසනයකදි රටේ මුලිකත්වය ගත් විරෝධාර රණවිරුවෝ, කොරොනා උවදුරෙදිත් මෙතෙක් පෙරමුන ගත් අය අතර පෙරමුනේ වුහ. කොවිඩ්-19 වෛරසය තවම මුළුමනින්ම පහ වී නැති අතර, මේ... තවදුරටත් විරෝධාර ඔබගේ සේවය රටට අත්‍යාවශ්‍යම කාලයයි. ජනතාව ආරක්ෂා කරන ඔබ... ආරක්ෂා වී සිටිය යුතුමයි.
එබැවින් මේ පුරුදු, පුරුදු කර ගමු !
දිනපතා ස්වයං පරීක්ෂණයකට ලක් වීම
රෝගියකු හෝ සැකසහිත පුද්ගලයකු පරීක්ෂාවට පෙර අනිවාර්යයෙන්ම ආරක්ෂිත ඇඳුම් පැළඳීම
6ft
සමාජ දුරස්ථභාවය පවා ගැනීම
• ගම්බාගම්බයේදී
• සේවා ස්ථානයේදී
• සේවා ස්ථානයේ භෝජනාගාරයේදී
• පිටත රාජකාර සේවයේදී
• සේවා ස්ථානයේ මිතුරන් හමුවේදී
නිරතුරුව සබන් හෝ විෂබීජ නාශකයක් යොදා තත්පර 20 පමණ හොඳින් දැස් සේදීම
ගිවිසින් පිටතදී, ගමනාගමනයේදී සහ රාජකාරියේදී මුඛ ආවරණයක් පැළඳීම
ආහාර පාන අනෙකුත් අය සමඟ හුවමාරුවෙන් වළකින්න
නේවාසිකාගාරයේ තුළ ආහාර ගැනීමෙන් හෝ ආහාර තැබීමෙන් වළකින්න
හැම විටම හිදෙන ඇඳවල් භාවිතයේදී තමන්ගේම ඇඳ ඇතිරිලි හා කොට්ට පමණක් භාවිතා කිරීම
ඔබගේ හිඳ ඇඳුම් (UNIFORM) පිටතින් හළුවා පිරිසිදු වී, නේවාසිකාගාරයට හෝ නවාතැනට ඇතුලු වීම
කොවිඩ් මෙහෙයුමට පෙර හා පසු භාවිතා කරන ආයුධ හා උපකරණ විෂබීජහරණය කිරීම
සැම විටම එක් කණ්ඩායම් ක්‍රමවේදයකට දිගටම සේවයේ යෙදීම
ගිවාඩු අවස්ථා වලදී සමාජ සම්බන්ධතා අවම කිරීම
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ පණිවිඩයකි
Ministry of Skills Development, Employment & Labour Relations
NIOSH
කොවිඩ්-19 රෝග ලක්ෂණ ඇති වූ හොත් ඉක්මනින් සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු හෝ වෛද්‍යවරයකු අමතන්න

සිවිවන පරිච්ඡේදය

2020 වර්ෂයේදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණ හා අභියෝග

2020 වර්ෂයේදී ආයතනයේ සුවිශේෂී ජයග්‍රහණ හා අභියෝග

2020 වර්ෂයේදී ගෝලීය වසංගත තත්වය හමුවේ ගෝලීය හා ජාතික ආර්ථිකය පසුබෑමකට ලක්වුවද ජාතික වාත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයට එම බලපෑම අවම කරගැනීමට හැකිවිය. ආයතනයට අපේක්ෂිත ඉලක්ක ඒ අයුරින්ම සපුරා ගැනීමට නොහැකි වුවද රුපියල් 11,057,350 ක ශුද්ධ ආදායමක් උපයා ගැනීමට හැකිවිය.

වසංගත තත්වය හමුවේ නිර්මාණශීලීව නව මානයන් ඔස්සේ ආයතනයේ වැඩ කටයුතු මෙහෙයවීම තුළින් මෙම ජයග්‍රහණය අත්පත් කරගැනිමට හැකි විය. එහිදී ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වීම, වසංගත තත්වය පාලනය සඳහා කර්මාන්තවලට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීම සඳහා නව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි කාලීන වශයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ආයතනයට අනුගත කරගැනිම තුළින් වසංගතය තුළින් අවස්ථාවක් උදාකර ගැනිමට ආයතනයට හැකිවිය.

2020 වර්ෂයේදී පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් අප ආයතනය අපේක්ෂිත ආදායම් අත්පත්කර ගැනිමට නොහැකි වීම ආයතනය මුහුණ දුන් ප්‍රධානතම ගැටළුව ලෙස පෙන්වා දිය යුතුය. වසංගත තත්වය තුළ සේවා සැපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුන්වා දුන්නද ප්‍රමාණවත් තරම් කාර්ය මණ්ඩලයක් සේවයට වාර්තා කිරීමට නොහැකි වූ බැවින් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට අපහසු විය. ඒසේම කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් තම පෞද්ගලික අවශ්‍යතා හේතුවෙන් ආයතනයෙන් ඉවත්වීයාම හේතුවෙන් පුහුණු කාර්ය මණ්ඩලය අඩුවීම ආයතනයේ කටයුතු කෙරෙහි සෘජුව බලපාන ලදී.

ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරීමට නොහැකි වුවද ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා මාර්ගගත ක්‍රමයට පැවැත්වීමට අවශ්‍ය කටයුතු ඉතා කෙටි කාලයක් තුළ සම්පාදනය කර ගැනීමෙන් පාඨමාලා මඟින් ලද ආදායම අඛණ්ඩව ලබාගැනිමට හැකි විය.

පස්වන පරිච්ඡේදය

ආයතනයේ මූල්‍යය ප්‍රගතිය

මූල්‍ය විශ්ලේෂණ 2019 - 2020

	2020	2019
වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලා වලින් ලද ආදායම	8,752,050.00	24,399,651.00
පාරිසරික මිනුම් වලින් ලද ආදායම	10,123,400.00	13,797,050.00
වෙනත් ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතා ගිවිසුම් තුලින් සපයනු ලැබූ සේවා සඳහා ලබාගත් ආදායම	4,558,200.00	3,831,365.00
වෛද්‍ය පරීක්ෂණ කටයුතු තුළින් ලද ආදායම	1,140,933.00	2,220,710.00
වෘත්තීය සෞඛ්‍ය, සුරක්ෂිතතා සතිය තුළින් ලද ආදායම	138,000.00	13,317,793.00
පොළී ආදායම	11,643,159.00	11,628,062.00
NIOSH සමාජිකත්ව ආදායම	131,000.00	62,250.00
වෙනත් ආදායම්	204,928.00	468,260.00
එකතුව	**36,691,670.00**	**69,725,171.00**

වගුව 5.1 ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. බීල්ඊඩබ්ලිව්/ඒ/එන්අයිඕඑස්එච්
/01/2020/06

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2021 සැප්තැම්බර් 8 දින

සභාපති,

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් ;01. ලේකම් - කම්කරු අමාත්‍යාංශය
02. ලේකම් - මූදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } එල්ඊඩබලිව/ඒ/එන්අයිඕඑස්එව් /01/2020/06

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2021 සැප්තැම්බර් 8 දින

සභාපති,

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිරිවැය රු.17,387,806 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂය සඳහා ලැබිය යුතු ආයෝජන පොළී ආදායම රු.832,890 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු පොළී ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.

(ඇ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී, 2020 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.1,040,449 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ලැබීම් ලෙස දක්වා නොතිබීම, රු.11,583,055 ක් වූ ආයෝජන පොළී ආදායම සහ රු.60,104 ක් වූ සේවක ණය පොළී ආදායම සහ අදාල මුදල් ලැබීම් නිවැරදිව ගැලපීම් නොකිරීම, රු.51,000 ක් වූ භාණ්ඩ අපහරණ ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොකිරීම හා රු.456,020 ක් පෙර වර්ෂයේ ගැලපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ ඇතුලත් කිරීම යන කරුණු හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ආයතනය විසින් 2018 වර්ෂයේදී රු.9,700,000 කට වැන් රථයක් මිලදීගෙන භාවිතා කර තිබූ නමුත් එය වාර්ෂිකව ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, රථ වාහනවලට අදාල ක්ෂය අනුපාතය, සටහන් මගින් හෙළිදරවු කර නොතිබුණු අතරම. වාහනයේ පිරිවැය ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛණයටද ඇතුළත් කර නොතිබුණි.

(ඉ) පරිත්‍යාගයක් මත මිලදී ගන්නා ලද රු.1,650,000 ක් වටිනා වෛද්‍ය උපකරණවලට අදාලව වාර්ෂික ක්ෂය රු.165,000 ක් වත්කම් ගිණුමෙන් අඩුකර තිබුණද එම ක්ෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට වියදමක් ලෙස ඇතුළත් කර නොතිබුණි. තවද, එම ක්ෂය වටිනාකමට සමාන ප්‍රමාණයකින් පරිත්‍යාගය, වාර්ෂික ක්‍රමක්ෂය කර, විලම්භීත අදායම් (Differed Revenue) ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළදී, රු.3,189,463 ක වටිනාකමකට ආයතනය විසින් ලබාගන්නා ලද භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් කර තිබූ වවුචර් 54කට අදාල ලදුපත් 54 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(එ) ආයතනය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර මහා භාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදාන පලමුව භාණ්ඩාගාර ප්‍රදාන ලෙස ගිණුම්ගත කර පසුව ඉකුත් වර්ෂවලදී ලද ප්‍රදාන පමණක් පදනමකින් තොරව ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රතිපූරණ කිරීම් ලෙස සමුච්චිත අරමුදලට එකතු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම නිසා රජයේ ප්‍රාග්ධන ප්‍රදානවල සමස්ථ ප්‍රමාණය වෙනුවට අදාල වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන මුදල් පමණක් මූල්‍ය ප්‍රකාශවල පෙන්නුම් කෙරුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණේ රු.1,040,449 ක් පමණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ආයතනයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.
මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකල වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 : 2 වගන්තිය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන,වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2009 අංක 38 දරන වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතන පනතේ 3 (1) (ග) උප වගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිති පිහිටුවීමට ආයතනය කටයුතු කල යුතු වුවත් 2021 අප්‍රේල් 30 දින දක්වාම එම ප්‍රමිති පිහිටුවා නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3 වෙනත් කරුණු

(අ) 2019 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සියළු භාණ්ඩවල ලෙජරය අනුව ශේෂය පමණක් සඳහන් කර තිබූ අතර තථ්‍ය ශේෂය සඳහන් කර නොතිබුණි. මේ අනුව ඌනතා සහ අතිරික්තතා ගණනය කර නොතිබූ අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිවැරදිතාවය තහවුරුකර ගත නොහැකි විය

(ආ) ආයතනයේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රදවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම රු.මිලියන 4.6 සිට රු.මිලියන 19.3 ක් දක්වා ප්‍රමාණයන් ජංගම ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි. එම නිසා අරමුදලට උපයාගත හැකිව තිබූ පොලී ආදායම අහිමි වී තිබුණි.

(ඇ) 2019 වර්ෂයේ ආයතනයේ ලිපිද්‍රව්‍ය වියදම රු.427,308 ක් වී තිබුණි . 2020 වර්ෂයේදී එම වියදම රු.1,223,216 ක් වූ අතර 2020 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් 2019 වර්ෂයට සාපේක්ෂව අඩුවෙන් සිදුකර තිබූ නමුත් ලිපිද්‍රව්‍ය වියදම රු.795,908 කින් එනම් සියයට 186 කින් ඉහළ යාමට හේතූන් විගණනයට අනාවරණය නොවුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න,
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඵල්ඊඩබ්/ඒ/එන්අයිඕඑස්එච්/එමඵල්/1/20/13(7)(ඒ)

මගේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ඔක්තෝම්බර් 29 දින

සභාපති,
ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

02. මේ සම්බන්ධයෙන් පහත සටහන් වශයෙන් උපුටා දක්වා ඇති මුදල් පනතේ 13 (8) වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමුකවනු කැමැත්තෙමි.

Atienagama.

ටී.ජී.අයි.පද්මිණි,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

පිටපත - 1. ලේකම්, කම්කරු අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය

මුදල් පනතේ 13 (8) වගන්තිය -

"7 උප වගන්තියේ (a) සහ (b) ඡේදවලට අනුව ඉදිරිපත් කෙරෙන වාර්තා අදාල ආයතනය විසින් සලකා බැලිය යුතුය. එසේ සලකා බැලීමෙන් පසුව ආයතනය විසින් විගණන වාරතාවේ පෙන්වා දී ඇති කරුණු පිළිබඳව ගැනීමට යෝජිත පියවර විගණන වාර්තාව ආයතනය වෙත ඉදිරිපත් කරන ලද දින සිට මාස 03 ක් තුල දන්වා සිටිය යුතුය."

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එල්ඊඩබලිව්/ඒ/එන්අයිඕඑස්එව /01/2020/06 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2021 ඔක්තෝබර් 29 දින

සභාපති,

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුලත්ව එහි කටයුතු පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව සභාපති වෙත ඉදිරිපත් කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (7)(ඒ) වගන්තිය ප්‍රකාරව ක්‍රියාත්මක කරන ලද විගණනයේ ප්‍රතිඵල මෙම වාර්තාව මඟින් නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම් කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම් හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්තයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ගැනීමට යෝජනා කරනු ලබන පියවර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත ආයතනයේ පාලක මණ්ඩලය විසින් මා වෙත දැන්වීම අවශ්‍ය වේ.

1.3 විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම හා ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.4 මූල්‍ය ප්‍රකාශන

1.4.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිරිවැය රු.17,387,806 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2020 වර්ෂයේදී මේ පිළිබඳව හඳුනාගෙන තිබූ නමුත් පැවති කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ එම කාර්යය සිදු කිරීමට නොහැකි වී ඇති අතර 2021 වර්ෂයේදී ඉවත් කල යුතු වත්කම් අපහරණය කිරීමටද භාවිතයට ගත හැකි අනිකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමටද අවශ්‍ය පියවර දැනටමත් ගෙන ඇත.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ඵලදායී ජීවිත කාලය තුල වාර්ෂිකව සමාලෝචනය කර ක්ෂය ප්‍රමාණය තීරණය කලයුතු බව

(ආ) පිරිවැය රු.676,665 ක් වූ වෛද්‍ය උපකරණ තොගයක් 2017 වර්ෂයේදී රු.340,000 කට ප්‍රත්‍යාගණනය කර තිබුණි. එසේ වුවද මෙම ප්‍රත්‍යාගණනය කරන ලද වෛද්‍ය උපකරණවල පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම්වලින් ඉවත් නොකොට පිරිවැය සහ ප්‍රත්‍යාගණිත අගයන් යන දෙකම ගිණුම්වල පවත්වාගෙන ගොස් තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2017 වර්ෂයේදී සිදුව ඇති ගිණුම් සටහන්වලින් ඉවත් කිරීමේ දෝෂය 2021 වර්ෂයේදී රු.676,665 පිරිවැය වූ වෛද්‍ය උපකරණ සඳහා පෙර වර්ෂ ගැලපුමක් ලෙස ගිණුම්වල නිවැරදි කිරීමට උපදෙස් ලබාදෙන ලදී.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ගිණුම්ගත කල යුතු වේ.
(ඇ) ආයතනය විසින් 2018 වර්ෂයේදී රු.9,700,000 කට වැන් රථයක් මිලදීගෙන භාවිතා කර තිබූ නමුත් එය වාර්ෂිකව ක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, රථ වාහනවලට අදාල ක්ෂය අනුපාතය, සටහන් මගින් හෙලිදරවු කර නොතිබුණු අතරම. වාහනයේ පිරිවැය ආයතනයේ ස්ථාවර වත්කම් ලේඛණයටද ඇතුළත් කර නොතිබුණි	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	නිරීක්ෂණය සමඟ එකඟවන අතර 2020 වර්ෂයේදී එක්සෙල් පත්‍රිකා (excel sheet) මගින් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීමේදී සිදු වූ දෝෂය ඉදිරියේදී නැවත ඇති නොවන බව තහවුරු කරමි. වැන් රථයේ 2020 වර්ෂයට අදාල ක්ෂය ගැලපීම ඉදිරියේදී පෙර වර්ෂ වල ගැලපීම යටතේ සටහන් කිරීමට උපදෙස් ලබා දී ඇත.	ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් මිලදී ගැනීම්, ක්ෂය කිරීම, හෙලිදරවු කිරීම කලයුතු බව.
(ඈ) පරිත්‍යාගයක් මත මිලදී ගන්නා ලද රු.1,650,000 ක් වටිනා වෛද්‍ය උපකරණවලට අදාලව වාර්ෂික ක්ෂය	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු	මෙම උපකරණ මිලදී ගන්නා අවස්ථාවේදී 2018 වර්ෂයේ ගිණුම් නැවත සංශෝධනය කර ඉදිරිපත් කෙරිණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමි ප්‍රකාරව ගිණුම්

රු.165,000 ක් වත්කම් ගිණුමෙන් අඩුකර තිබුණද එම ක්ෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට වියදමක් ලෙස ඇතුළත් කර නොතිබුණි. තවද, එම ක්ෂය වටිනාකමට සමාන ප්‍රමාණයකින් පරිත්‍යාගය, වාර්ෂික ක්‍රමක්ෂය කර, විලම්භීත අදායම් (Differed Revenue) ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.	කිරීම අවශ්‍ය වේ.	ඔබ විසින් යෝජනා කර ඇති පරිදි ගිණුම් තැබීමේ නිවැරදිතාවය සහාථ කරමින් මෙම වත්කමෙහි ක්ෂය සම්බන්ධව ගිණුම් සටහන් තැබිය යුතු ආකාරය පිළිබඳ පැහැදිලි නිර්දේශයක් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි.	තැබිය යුතු බව.

1.4.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද / පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වර්ෂය සඳහා ලැබිය යුතු ආයෝජන පොලී ආදායම රු 832,890 ක් අඩුවෙන් ගිණුම් ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා ලැබිය යුතු පොලී ආදායම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ගණනය කිරීමේදී සිදුවී ඇති මගහැරීම් පෙර වර්ෂයේ ගැලපුම් ලෙස 2021 වර්ෂයේ නිවැරදි කිරීමට ගණකාධිකාරීට උපදෙස් ලබාදුනි.	එකහ වූ පොළී අනුපාත හා නිවැරදි කාල පරිච්ඡේද සැලකිල්ලට ගෙන පොළී ගණනය කිරීම කල යුතුවීම.
(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාරක ප්‍රාග්ධන	නව	පවත්නා	මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රග්ධන සංචලන	රාජ්‍ය අංශ

		සංචලන යටතේ ගෙවිය යුතු ගිණුම්වල අඩුවීම රු.630,191 ක් වුවත් රු.466,313 ක් ලෙස රු.163,878 ක් වැඩියෙන් දක්වා තිබුණි.	පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	රු.466,313 ක් ලෙස ආයතනය ගණනය කර ඇත්තේ 2018 හා 2019 වර්ෂයන්වලදී ගෙවිය යුතු මුළු වගකීම්වලින් පාරිතෝෂික දීමනා අඩුකල පසු ලෙබෙන වෙනස ගැලපීමෙනි. එබැවින්, විගණනයේ සඳහන් රු.163,378 ක් වැඩියෙන් දක්වා තිබෙන බවට වූ විගණන නිරීක්ෂණය සමඟ එකඟවිය නොහැකි බව දන්වමි.	ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව හා එහි දක්වා ඇති නිශ්චිත මගපෙන්වීම්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ආයතනය කටයුතු කල යුතු බව..
(ඇ)	නව	මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී, 2020 වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු.1,040,449 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මුදල් ලැබීම් ලෙස දක්වා නොතිබීම, රු.11,583,055 ක් වූ ආයෝජන පොළී ආදායම සහ රු.60,104 ක් වූ සේවක ණය පොළී ආදායම සහ අදාල මුදල් ලැබීම් නිවැරදිව ගැලපීම් නොකිරීම, රු.51,000 ක් වූ භාණ්ඩ අපහරණ ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් නොකිරීම හා රු.456,020 ක් පෙර වර්ෂයේ ගැලපුම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී නිසි අවධානය යොමුකරන ලෙස උපදෙස් ලබාදී ඇත. රු.51,000 ක මුදල අබලි ද්‍රව්‍ය විකිණීමෙන් ලද ආදායමක් වන අතර ආයෝජනයක් නොවේ. රු.456,020 ක් වූ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ පොලී ආදායම පෙර වර්ෂය හා සැසඳීමෙන් පෙර වර්ෂයට කලයුතු ගැලපුමක් සේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර ඇත.	ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කල යුතු බව.

ඇතුලත් කිරීම යන කරුණු හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය.				
(ආ) සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමට අදාල වියදම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව රු.175,638 ක් වුවත් ස්ථාවර වත්කම් ලේඛනයට අනුව රු.159,329 ක් විය. මේ අනුව ශේෂයන් අතර රු.16,309 ක වෙනසක් නිරීක්ෂණය විය.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය සහ ගිණුම් අතර වෙනස හඳුනාගෙන ගිණුම් නිවැරදි කිරීමට උපදෙස් ලබාදී ඇත.	නිවැරදි සංඛ්‍යා ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.
(ඇ) ආයතනය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර මහා භාණ්ඩාගාරය මගින් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදාන පලමුව භාණ්ඩාගාර ප්‍රදාන ලෙස ගිණුම්ගත කර පසුව ඉකුත් වර්ෂවලදී ලද ප්‍රදාන පමණක් පදනමකින් තොරව ප්‍රාග්ධන ප්‍රදාන ප්‍රතිපූරණ කිරීම් ලෙස සමුච්චිත අරමුදලට එකතු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ආයතනයේ සියළුම ගිණුම්කරන කටයුතු Quick Book පරිගණක මෘදුකාංගය තුළින් ගිණුම් සකසන අතර 2019 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් (වියදම් Excel Sheet) පත්‍රිකාවේ ඉදිරිපත් කරන මූල්‍ය වාර්තාවල වෙනමම සටහන් යටතේ ඉදිරිපත් කෙරුනත් එම ප්‍රාග්ධන ලැබීම් ගිණුම්කරණ පද්ධතිය මගින් සමුච්චිත අරමුදලට ස්වයංක්‍රීයව එකතු වන අතර එය ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී එම ගැලපුම් නැවත ඊළඟ වර්ෂයේ සටහන් අංක 4 යටතේ	ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමේ ගිණුම් ප්‍රතිපත්තියක් සකස් කර මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කළ යුතු වීම හා ඒ අනුව ගිණුම් තැබිය යුතු වීම.

එම නිසා රජයේ ප්‍රාග්ධන ප්‍රදානවල සමස්ථ ප්‍රමාණය වෙනුවට අදාල වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන මුදල් පමණක් මූල්‍ය ප්‍රකාශවල පෙන්නුම් කෙරුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ප්‍රමාණය රු.1,040,449 ක් පමණි.

සමුච්චිත අතිරික්තය සෑදුනු ආකාරය සවිස්තරාත්මකව ඉදිරිපත් කරනු ලබයි.

1.4.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මිලදී ගැනීම් හා සේවා	3,189,463	ආයතනය විසින් ලබාගන්නා ලද භාණ්ඩ හා සේවාවලට අදාල බිල්පත් 54 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර අදාල ඉන්වොයිසි පමණක් වවුචරයට අමුණා තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	විගණන විමසුමෙහි සඳහන් ආකාරයට ඉන්වොයිස් පත් මත පිහිටුවා වවුචර් පත් මගින් අදාල ගෙවීම් සිදුකර බවට සඳහන් කර ඇති නමුත් වවුචර් පත් පිටුපසෙහි අදාල මුදල් ලබාගත් බවට අත්සන යොදා ඇත. එමෙන්ම විගණනයෙන් ඉදිරිපත් කරන ලද වවුචර් පත් අතුරින් වැඩි ප්‍රමාණයක් ආයතනයේ වාහන	ගෙවීමක් සිදුකල පසු එම ගෙවීම සනාථ කර ගැනීම සඳහා බිල්පත් ලබාගත යුතු බව.

සේවා කිරීම් ගාස්තු ගෙවීම සඳහා වන අතර ප්‍රවාහන භාර නිලධාරී එම සේවාවන් ලබාගත් බවට තහවුරු කර තිබේ.
නමුත් ඉදිරියේදී ගෙවීම් කටයුතු සිදුකිරීමේදී එම මුදල ලද බවට එම සේවාවන් ලැබූ සැපයුම්කරුවන්ගෙන් සනාථ ලිපි හෙවත් රිසිටිපත් ලබා ගැනීමට උපදෙස් ලබාදී ඇත.

1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2009 අංක 38 දරන වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතන පනත					
(i) 3 (1) (ග) උප වගන්තිය	වෘත්තීය ආරක්ෂණය සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම	කර්මාන්තශාලා අඥා පනතට අමතරව 2009 අංක 38 දරන වෘත්තීය සුරක්ෂිතතා, සෞඛ්‍ය හා සුභසාධන පනත අනුව කටයුතු	

	ජාතික ප්‍රමිති පිහිටුවීමට ආයතනය කටයුතු කල යුතු වුවත් 2021 අප්‍රේල් 30 දින දක්වාම එම ප්‍රමිති පිහිටුවා නොතිබුණි.		අවශ්‍ය වේ.	පනත ලෙස නව පනතක් ගෙන ඒමට සියලු කටයුතු සූදානම් කර ඇත. එම නව පනත සම්මත වීමෙන් අනතරුව අදාල ප්‍රමිති පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. කල යුතු බව.
(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 : 2 වගන්තිය	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, වාර්ෂික කාර්යසාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	16.2 වගන්තිය ප්‍රකාරව වෙනමම මූල්‍ය ප්‍රකාශන සමඟ ආයතනයේ කාර්යසාධන වාර්තා ඉදිරි වර්ෂවලදී ගිණුම් ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට ක්‍රියාකරනු ඇත. කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

1.6 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක්ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ආයතනයේ මෙහෙයුම් කටයුතු	නව	නව	රු.මිලියන 5.9 ක ප්‍රමාණයක් සංචිතයක් ලෙස තබා	බැංකු ශේෂය හඳුනාගෙන

සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රදවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් ඵලදායීව ආයෝජනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේදීම රු.මිලියන 4.6 සිට රු.මිලියන 19.3 ක් දක්වා ප්‍රමාණයන් ජංගම ගිණුමේ නිෂ්කාර්යව පැවතුණි. එම නිසා අරමුදලට උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

පද්ධතියක් හඳුන්වා දිය යුතුය.

ගැනීමට සිදුවූයේ 2020 වර්ෂයේදී වෛද්‍ය උපකරණ හා පරිගණක (Laptop) උපකරණ මිලදී ගැනීමට අපේක්ෂා කල බැවිනි. මේ වන විට පරිගණක (Laptop) මිලදීගෙන ඇතත් වරන්වර කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත එම උපකරණ ආනයනය කිරීම ප්‍රමාදවීම හේතුවෙන් ආයෝජනවල මුදල් තැන්පත් කිරීමට හැකියාවක් නොවූ අතර මෙම විගණන නිරීක්ෂණයෙහි සඳහන් ආකාරයට උපයාගත හැකිව තිබූ පොලී ආදායමක් අහිමි නොවූ හෙයින් එකඟවිය නොහැකි බව දන්වා සිටිමි. කෙසේ වුවද, ආයතනයේ ඇති මුදල් ශේෂය පිළිබඳ නිසි ඇගයීමකින් අනතුරුව විධිමත් පරිදි තක්සේරුවකින් අනතුරුව මුදල් ආයෝජනය කිරීමට කටයුතු කරන බව දන්වමි.

අතිරික්ත මුදල් කෙටිකාලීන ඉතුරුම් ක්‍රමයක ආයෝජනය කිරීමට කටයුතු කල යුතු බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,057,350 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.28,130,642 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,073,292 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කෝවිඩ් 19 වසංගතය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 11.1 ඡේදය ඉදිරි මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට පෙර පසුගිය වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2021 අප්‍රේල් 30 දින දක්වාම අවසන් කර	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	ආයතනය විසින් භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2021 පෙබරවාරි මස 26 දින කෙරුණු අතර විගණනයේ සඳහන් දිනට සිදුකිරීමට නොහැකි වූයේ රට තුල පවතින කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ අදාල නිලධාරීන් සංචරණ සීමා අයත් ප්‍රදේශවල වාසය කරන බැවින් සේවය සඳහා ගෙන්වා ගැනීමට අපහසු වූ බැවින්ය. නමුත් මේ වන විට කොවිඩ් - 19 වසංගත	රාජ්‍ය මුදල් චක්‍රලේඛය 01/2020 ප්‍රකාරව කටයුතු කල යුතු බව.

නොතිබුණි.			තත්ත්වයක් හමුවේ වුවද භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.	
(ආ) 2019 වර්ෂයට අදාල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සියළු භාණ්ඩවල ලෙජරය අනුව ශේෂය පමණක් සඳහන් කර තිබූ අතර තථ්‍ය ශේෂය සඳහන් කර නොතිබුණි. මේ අනුව ඌනතා සහ අතිරික්තතා ගණනය කර නොතිබූ අතර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිවැරදිතාවය තහවුරුකර ගත නොහැකි විය.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2019 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධයෙන් තථ්‍ය ශේෂය සටහන් නොවීම සම්බන්ධයෙන් එකඟ වන අතර, කමිටු සාමාජිකයන් විසින් එම අත්සන්වලට පෙර (අවශ්‍ය පිටුවේ) අතිරික්තයක් හෝ ඌනතාවයක් නොමැති බවට සඳහන් කර ඇති බව ප්‍රකාශ කර සිටිමි. ඉදිරියේදී අදාල වාර්තාවන් ආයතනය වෙත යැවීමට ප්‍රථම නැවත පරීක්ෂා කරන ලෙස භාණ්ඩ සමීක්ෂණ කමිටු මෙන්ම අදාල වගකිව යුතු සියලු නිලධාරීන් හට උපදෙස් ලබාදුනි.	මු.රෙ.757 පරිදි 66 ආකෘතිය අනුව සමීක්ෂණ කටයුතු සිදුකල යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2019 වර්ෂයේ ආයතනයේ ලිපිද්‍රව්‍ය වියදම රු.427,308 ක් වී තිබුණි . 2020 වර්ෂයේදී එම වියදම රු.1,223,216 ක් වූ	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2019 වර්ෂයේ මුල තොග ලෙස පැවති රු.644,856 ක් වටිනා ලිපිද්‍රව්‍ය තොග 2020 වර්ෂය සඳහා ලබාගත් අතර 2020 වර්ෂයේ	වර්ෂයට අදාල ආදායම නිවැරදිව පෙන්නුම් කරන ආකාරයට

	අතර 2020 දෙසැම්බර් 31 දිනට ගබඩාවේ ඉතිරි ලිපිද්‍රව්‍ය තොගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් 2019 වර්ෂයට සාපේක්ෂව අඩුවෙන් සිදුකර තිබූ නමුත් ලිපිද්‍රව්‍ය වියදම රු.795,908 කින් එනම් සියයට 186 කින් ඉහළ යාමට හේතූන් විගණනයට අනාවරණය නොවුණි.		ලිපිද්‍රව්‍ය වියදම රු.578,359 ක් විය. 2020 වර්ෂයේ මිලදීගත් ලිපිද්‍රව්‍ය 2021 වර්ෂයේ දී මේ වන විටත් භාවිතා වන අතර 2021 වර්ෂය සඳහා දරා ඇති වියදම මේ වන විට රු.68,694 කි. උපලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට උපදෙස් ලබාදෙන ලදී.	වර්ෂයට අදාල වියදම හා ඉතිරි තොගය ගණනය කල හැකි පරිදි ලිපිද්‍රව්‍ය තොග ලේඛන පවත්වාගත යුතු අතර ඉතිරි තොගයක් ඇත්නම් එය මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කල යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2021 ජූනි 15 දිනටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2019 වාර්ෂික වාර්තාව නිර්වදනභාවය පරීක්ෂා කිරීම සඳහා ප්‍රකාශන කමිටුව සඳහා ලබාදී 2021 අප්‍රේල් මස 10 වන දින එය	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු බව.

නැවත ආයතනයට ලැබී ඇති අතර අදාල නිවැරදි කිරීම් සිදුකර මුද්‍රණ කටයුතු නිම කර 2021 ජුනි 15 දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ඇත.

ටී.ජී.අයි.පද්මිණී,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

සටහන්:

සටහන්:

සටහන්: